# සතර කෝරළයේ ඉතිහාසය ගොඩනැගීමේදී ජනප්‍රවාදවල දායකත්වය පිළිබඳ විමසුමක්

එම්.වී. චන්ද්‍රසිරි[1], එන්. එච්. ටී. අනුරුද්ධ[2]

[1]ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

[1]mvchandrsiri99@gmail.com

[2]tharanga.slu@gmail.com

## සංක්ෂේපය

ඉතිහාසය ගොඩනැගීමේ දී මූලාශ්‍රයක් වශයෙන් ජනප්‍රවාද හෙවත් ජනශ්‍රැතියට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. කිසියම් රටක ප්‍රදේශයක ඉතිහාසය ඉපැරණි ද ඒ හා සමානව ජනශ්‍රැතිය ද ඉපැරණි වන අතර ජනශ්‍රැතීන් හා ඉතිහාසය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවයකි. සෑම සමාජයක ම සංස්කෘතික ක්‍රියාදාමය පෝෂණය වීමට කටවහර ඔස්සේ ආ පාරම්පරික දැනුම වැදගත් වේ. මිනිසාගේ රුචි අරුචිකම්, හැසිරීම්, පුරුදු, සිරිත් විරිත් ආදියෙහි සමස්තය සංස්කෘතිය නම් එය නිර්මාණය වීමට පාරම්පරික ජන විඥානය දැඩි ලෙස බලපා ඇති බව කිව යුතු ය. සතර කෝරළය උඩරට නිලමේවරුන් බොහෝ දෙනෙකුගේ වාසභූමිය වූ බැවින් ඒ නිලමේවරු සම්බන්ධ මුඛ පරම්පරාගත ජනප්‍රවාද බොහෝමයක් ඇත. එමගින් ඉතිහාසයට යමක් එකතු කළ හැකි සේම මිත්‍යා මත බිඳ හෙළීමද කළ හැකිය. කප්පාගොඩ නිළමේ, ලෙව්කේරාළ රණශූරයන් බවත් රාජ්‍ය සම්මාන ලැබූ බවත් මෙම ජනප්‍රවාදවලින් හෙළිවේ. පැරණි සිංහල රජවරුන් සතර කෝරළයේ ගිරිකඳුරු, ආරක්ෂක ස්ථාන කරගත් බව ජනප්‍රවාදවලින් තහවුරු වේ. ලේඛන ව්‍යවහාරය ආරම්භ කිරීමට ප්‍රථම මානව වර්ගයාගේ හැඟීම්, අදහස් උදහස් අන් අයට සන්නිවේදනය වී ඇත්තේ කටවහරෙනි. ජනප්‍රවාද සාමුහික උපතක් නිසා මිනිස් සමූහයා අතරේ ව්‍යාප්ත වේ. ''ජන සමාජයක මුඛ්‍ය පරම්පරාගත ව කලක් තිස්සේ පැවත එන සාමූහික ඥාන සම්භාරය ජනශ්‍රැතියයි''. එය ගද්‍ය හෝ පද්‍යයන් පැවත ආවක් විය හැකිය[1] (රත්නපාල, 1995, පි. 10-12).

**ප්‍රමුඛ පද** - කටවහර, ජනශ්‍රැතිය, ඥාන සම්භාරය, පාරම්පරික දැනුම, මුඛ පරම්පාරාව

# An Analysis of the Contribution of the Folklore to the construction of history in Sathara Korale

## Abstract

Folklores are very important as a source in the narration of the history. History of folklores is as old as the history of any area or country, moreover folklores and history are inextricably linked. Traditional knowledge which was passed down through word of mouth is essential to enrich culture in any country. If the culture is collection of human's interest, behavior, habits and rituals, human consciousness (*Wiganaya*) highly affect to create it. There are numerous folklores regarding elites of Kandyan kingdom who lived in Sathara Koralaya. It could be added new facts to history, simultaneously could be broken down the myths in history utilizing the folklores. Following facts reveal from folklores in Sathara Koralaya including, Kappagoda Nilame and LewkeRala (both who were royal officials in Kandyan Court) were great warriors who received royal awards, utilization of mountains in Sathara Koralaya by Sinhalese kings for security purposes etc. Human feelings, opinions and ideas were communicated through word of mouth before the origin of writing. Since folklores are collective birth of human, it spread among them. 'Folklores are the collective epistemological wealth which have been passed down orally from generation to generation as well as have been practiced for a long time'. 'It may have existed either prose or verse'. (Rathnapala, 1995, P. 10-12).

**Keywords-** Epistemological wealth, Folklore, Oral tradition, Traditional knowledge, Word of mouth

## 1. හැඳින්වීම

කෝට්ටේ යුගයේ දී සතර කෝරළයට අයත් තුන් කෝරළය හා පාතබුලත්ගම යන පාලන කොට්ඨාස දිසාවේවරුන් යටතේ පාලනය විය. සතර කෝරළය නැවත ගලබඩ කෝරළය, පරණකුරු කසගොඩ කෝරළය, බෙලිගල් කෝරළය, තුන් කෝරළය, යනුවෙන් කෝරළගේ කෝට්ඨාස නැමති පාලන ඒකක පහකට බෙදනු ලැබීය. කෝරළය කරවන නිලධාරියා ''කෝරාළ" නමින් හඳුන්වනු ලැබිණි. මහනුවර යුගයේදී ඉතා වැදගත් තීරණාත්මක දිසාවක් වූ සතර කෝරළයේ විරුවන් විසින් කරන ලද සූරවීරකම් හේතුවෙන් සතර කෝරළය අවස්ථා කිහිපයක දී ගරු බුහුමන් (මාන්න පහ) ලැබූ බව ජනප්‍රවාදයේ එයි[2] (Senaverathna, 1918, P.93).

කොඩියකුත් රතු බැඳපු සවරන් සදන යුධයට පෙරමුණේ
කොතවියන් සහ පච්චලන්සේ දවුණ්ඩයකුත් සමඟිනේ
කොඩියකුත් තව පිහිටි ඉරහඳ මානපස මේ සමඟිනේ
මේ සිරිත් ඇති සතර කෝරළෙ දිසාවේ යති පෙරමුණේ[3] (Senaverathna, 1918, P.93)

1833 දී කෝල්බෘක් කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ පළාත් බෙදීමේදී සතර කෝරළය බස්නාහිර පළාතට අයත් විය. 1889 දී සබරගමු පළාත නිර්මාණය කිරීමේ දී එම පළාතට කැගල්ල දිස්ත්‍රික්කයට ඇතුළත් කෙරිණි[4].

## 2. අධ්‍යයන ක්‍රමවේදය

සතර කෝරළයේ ජනප්‍රවාද පිළිබඳ අධ්‍යයනය පැරණි අත්ලිපි මූලාශ්‍ර උපයෝගී කරගෙන කරන ලද්දකි. කොළඹ කෞතුකාගාර පුස්තකාලය සහ රාජ්‍ය ලේඛනාගාරය වැනි ආයතනයන්හි මෙවැනි දුර්ලභ ඝණයේ අත්පිටපත් තැන්පත් කොට තිබේ. මෙවැනි මූලාශ්‍ර පරිපාලනය කරමින් The Ceylon Antiquary and literary and literary Registon වැනි කෘති 20වන සියවසේ මුල් භාගයේ රචනා විය. මෙම අධ්‍යයනයේ දී එම කෘති පරිශීලනය කෙරිණි. මීට අමතරව සතර කෝරළය පිළිබඳ ලියවුණු පත පොත ද අධ්‍යයනය කරන ලදී.

## 3. සාහිත්‍යය විමර්ශනය

සාහිත්‍ය පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ට වඩා අඩු වැදගත්කමක් ජනප්‍රවාදවලට හිමි වුව ද ඉතිහාසකරණයේ දී එය අද්විතීය මූලාශ්‍රයකි. ඉතිහාසයේ සිදු වූ සෑම සිදුවීමක් ම සාහිත්‍ය මූලාශ්‍රවල හෝ වෙනත් මූලාශ්‍රවල සඳහන් ව නො තිබෙන අතර වැදගත් තොරතුරු මගහැරී යන අවස්ථා ඇත. ඒ අඩුව පිරිමසා ගැනීමට ජනප්‍රවාදවලින් ලැබෙන්නේ මහඟු පිටුවහලකි.

ජනප්‍රවාද බිහිවී තිබෙන්නේ කිසියම් අතීත සිදුවීමක් පදනම් කරගෙනයි. එවැනි විශේෂත්වයක් සතර කෝරළයේ වීරවරයන් උඩරට රජුගෙන් ගරු බුහුමන් ලබාගත් ආකාරය විමසා බැලීමෙන් පැහැදිලි වේ. විශේෂයෙන් දෙවන රාජසිංහ රජු සතර කෝරළයට ලබාදුන් උපහාර පහක් පිළිබඳ ජනප්‍රවාද ගත තොරතුරු වැදගත් වේ. එම තොරතුරු ලේකම්මිටිවල ද සඳහන් වේ. සතර කෝරළයේ මායිම් ගැන තොරතුරු සඳහන් කරන ජනප්‍රවාදවල පුරාවිද්‍යාත්මක තොරතුරු සඳහන් වේ. සතර කෝරළයේ රණගිරි කන්ද, ඉර හඳ සලකුණු සහ කඩුගන්නාවේ ''සේසත්'' ලකුණු ඇති ගල් පර්වත ලෙස සඳහන් වේ. මේවා එදා ගැමියන් දුටු පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති සලකුණු ය.

## 4. පුරාතන බෙදීම් අනුව සතර කෝරළය

පුරාණ බෙදීම් අනුව උතුරෙන් හා බටහිරින් සත්කෝරළයට ද, නැගෙනහිරින් ඌව පළාතට ද, දකුණෙන් තුන් කෝරළයට ද සතර කෝරළය මායිම් ව තිබිණි[5].

පැරැණ්නෝ ඇල්පිටිකන්ද, බුලත්ගමු කන්ද, කරගල, රහලගල, මිණිකදවල අසුපැනි ඇල්ල, බොවිල, මාතලාගල, මුරුතේ කඩඉම, ඌනන්කන්ද, බුජ්ජමුව, මාවෙලාකන්ද, පේරුවාගල, වැදිගල, නයියුත්පාන, රතගල, පිටගල, අරුග්ගම, කොටියාකුඹුර, දුම්මලගෙදර කන්ද, මීයන් ඇල්ල, බලන කඩුගන්නාව, මාවෙල, ලගමුව යන සූවිසි (24) ස්ථානයක් සතර කෝරළයට මායිමේ පැවති බව ජනප්‍රවාදයේ එන තොතුරුවලින් පැහැදිලි වේ. ඒ හා සම්බන්ධ දනන්තුඩ වැකෙන කවි පෙළ මෙසේ ය.

වෛකුණ්ඨය සදිසි ඇල්පිටි කන්ද ගල
බුලත්ගමු කන්ද කරගල රහල ගල
රන් ආදා ලගින මිනිකඳ කියන වල
අසුපිනි ඇල්ල වැටුනේ ගම්මැදින් බෙරවිල[6] (Lewis, 1918, P.95)

මාතලා ගලින් මුරුතේ කඩ ඉම ට
ඌනන් කන්ද පසුකරගොස් වැදි ගල ට
නයියුත්පාන සහ රතගල පිට ගල ට
ආරුක් ගමින් කොටියා කුඹුරේ ඉම ට

දුම්මල දෙනිකන්ද පසුකරගෙන ගොසිනා
ඉරහඳ කෙටු රණගිරි මුදුනෙන් බසිනා
බුජ්ජිම තොටද මාවෙලකන්ද මුදුනෙනා
සේරුවාගලේ උතුරට කොණින් යනා

මීයන් ඇල්ල බලනේ කඩවත ඇහැ ලේ
කඩුගන්නාව පිට සේසත කෙටු ග ලේ
මාවෙල උඩුපිටින් ලගමුව ද පසු ක ලේ
මෙලකුණු වලට මැදිරට සතර කෝර ලේ[7] (පොතුහැර,1959, පි. 01)

## 4.1 සතර කෝරළයට ගෞරවය ගෙනදෙන සිව්ප්‍රාසාද

වට්ටාරම මලිමාපාය, හිඟුලේ කිරුම්ගල් පාය, බෙලිගල විජය සුන්දර පාය, දිප්පිටියේ රාජගිරි මල් පාය, එම සිව් ප්‍රාසාදයන් වේ. ලංකාද්වීපයේ අවසන් මහා රහතන් වහන්සේ වූ මලියදේව මහා රහතන්වහන්සේගේ ධාතු නිදන් කර බඳවන ලද චෛත්‍ය රාජයා මනිපාය නමින් හැඳින් වේ[8]. මෙය පිහිටියේ කිණිගොඩ කෝරළයේ ය. හිඟුලේ හිරුම්ගල්පාය මහා දෙවිඳුන් සම්බන්ධ පායකි. එය ගල්බඩ කෝරළයේ පිහිටා ඇත. විජය සුන්දරපාය පිහිටා ඇත්තේ බෙලිගල් කෝරළයේ ය[9]. රාජගිරි මල් පාය පිහිටුවා ඇත්තේ පරණකුරු කෝරළයේ ය. මෙම ප්‍රසාද සතර සතර කෝරළ ඓතිහාසිකත්වය මනාව තහවුරු කරයි[10].

## 4.2 මාන්න පහ (උපහාර පහ)

සතර කෝරළය විසූ වීරවරයෝ උඩරට රජවරුවන්ගෙන් නම්බුනාම සමඟ මාන්න පහක් ලැබූහ[11]. උඩරට රාජධානියේ කිසිඳු ප්‍රදේශයකට මෙවැනි මාන්න ලබා ගැනීමට නොහැකි විය. සතර කෝරළයට මාන්න පහ ලැබී ඇත්තේ දෙවැනි රාජසිංහ රජුගෙන් බව කියැවේ. මෙලෙස ලබාගත් මාන්න පහ හේතු කොට ගෙන යුද බිමේදීත්, රාජකීය උත්සවවලදීත් දළදා පෙරහැරේත්, මුල්තැන හිමි වූයේ සතර කෝරළ වැසියන්ට ය. ඉරහඳ කොඩිය දවුන්ඩය, පච්චලන්සය, කොතවිය සහ සවරන් බැඳි රතු කොඩිය යනු ඒ මාන්න පහයි. මේ පිළිබඳ තොරතුරු මහ ලේකම් මිටියේ සඳහන් වේ[12].

රුහුණු මායා පිහිටි තුන් ලක කන්ද උඩරට සතක් ඇත්තේ
වාන සිදුරුය නමින් පරසිඳු උඩුනුවර මුල් කොට පැවැත්තේ
පාන සිවිකුඩ ලෙසින් නුවරට සිව්දෙසින් සිව් දිසාලන්තේ
මාන පස ලත් කෝරළය සිව් මෙ මහනුවරට ඉදිරි පැත්තේ

රාම දෙව්රද දෙවුන්දර සිට අළුත් නුවරට වඩින ගමනේ
සැම සිව්රඟ සෙනග සැදෙමින් මගුල් දිව පෙරහැරින් සොඳිනේ
සෝම රිවිරුව පිහිටි කොඩියද පෙරටු කර ආ බැවින් එදිනේ
ඒ මහත් මානයක් සිව් කෝරලේ හට වනි එතැන් පටනේ[13]

දවුන්ඩය සහ පච්චලන්සය ලැබුණු සැටි මෙසේ ය. දෙවැනි රාජසිංහ රජුගේ පාලන සමයේ දී රටවාසීන් සහභාගී වී පවත්වන ලද ජාතික උත්සවයට රජතුමා සහභාගී වූයේය. ඒ සඳහා දක්ෂ නිර්භීත ක්‍රීඩකයන් කැටුව අදිකාරම්වරු රටේ මහත්වරු, කෝරළේ මහත්වරු, සහ ගම්මුලාදෑනීහු රැස් වූහ. ක්‍රීඩා අවසානයේ දී දක්ෂතම ක්‍රීඩකයා තේරීමට රජුට අවශ්‍ය විය.

රාජමංගල භාණ්ඩවන දවුණ්ඩය සහ පච්චලන්සය ඉතා උස පොල්ගසක් මුදුනේ බන්දවා හැකි අයෙකුට ඒවා රැගෙන එන ලෙස රජතුමා දැන්වූයේය[14]. සියළු දෙනාම නිහඬව සිටියදී සතර කෝරළයෙන් පැමිණ සිටි නිර්භීත පුරුෂයෙක් තිස්රියනක් ඉහළට පැන ඉහත කී භාණ්ඩ ගෙනවිත් රජුට දුන්නේය. ප්‍රීතියට පත් රජතුමා ඔහුට ඒ භාණ්ඩ දෙක තෑගි කළේය[15].

හරින්ඩේ කොළඹ රජසිංහ නිරිඳු රයිගම් වන්න වැඩ සිට
දවුණ්ඩේ සහ පච්ලන්සේ එල්ලමින් පොල් තුරක එම විට
ගෙනෙන්ඩේ වදහලෙන් කප්පිතාගේ තරමද දැක් වූ අත්පිට
දවුණ්ඩේ සහ පච්චලන්සේ ලැබුණි සිව් කෝරළේ මානෙට[16]

ඉරහඳ කොඩිය සතර කෝරළයට ලැබුණේ ද රාජසිංහ රජතුමාගෙනි. ජාතික උත්සවයකදී විවිධ ප්‍රදේශවලින් පැමිණි ක්‍රීඩා කණ්ඩායම්වලට කොඩි පවරා දෙන ලදී. ඒ කොඩි ලැබුණු ආකාරය මෙසේය. සතර කෝරළයට ඉරහඳ කොඩිය ද, ඌවට හංස කොඩිය ද, සබරගමුව කහපාට කොඩිය ද, තුන් කෝරළයට භේරුණ්ඩ කොඩිය ද, වලපනේ වියළුවට මයුර කොඩිය ද, ඌව පළාතට නෙළුම්මල් කොඩිය ද, නුවර කලාවියට ගජ සිංහ කොඩිය ද, වෙල්ලස්සට කොටියා කොඩිය ද, බින්තැන්නට ගිරවා කොඩිය ද,තමන් කඩුවට වළහා කොඩිය ද, යනුවෙනි. මෙයින් සමහර කොඩි සිංහල රාජ්‍යයේ ප්‍රධාන කොඩි වශයෙන් සලකා තිබුණි[17].

## 4.3 අසුපැනි ඇල්ල

''පෙර ලක්දිව එක්තරා නර ශ්‍රේෂ්ඨයෙක් ද්‍රවිඩයන් සමග සටනට යාමට ප්‍රමාණවත් ශක්තියක් නොමැතියැ යි සිතා, රජු සිය පිරිවරත් සමඟ මා ඔය ඉහළට ගමන් කොට, අසුපැනි ඇල්ල සමීපයේ සැඟවී සිටියේය. එතුමාගේ බිසෝවරුන් තිස්දෙනා සැඟවී සිටි ලෙන තිස් කුමාරි ලෙන නමින් හඳුන්වයි. මෙම ලෙන ඇල්ලේ දිය පහරින් වැසී තිබේ. රජු මෙම ස්ථානයේ සිට සේනා සංවිධානය කොට සූදානම් වූයේ ය. යුද්ධයේ දී ජය පරාජය බලාපොරොත්තු වූ බිසෝවරු නො ඉවසිල්ලෙන් පසු වූහ''[18] (පොතුහැර,1959, පි.03,04). සුදු කොඩිය එසවීමෙන් ජය හඟවන බව රජතුමා ප්‍රකාශ කළේය. යුද්ධයේදී රජුට ජය අත්වුවත් කොඩිකාරයා බීමත්කමින් සිටි නිසා එසවූයේ කළු කොඩිය යි. මෙය දුටු බිසෝවරු ලෙනෙන් පැන දිවිනසා ගත්හ. බිසෝවරුන්ගේ මළකඳන් තිබුණු වළ මිනිකදවල නම් විය.

''රජතුමා තිස්කුමාරි ලෙන කරා පැමිණියේ බිසෝවරුන් නොදැක ඉතා ශෝකීව අසු පිටින්ම ගල මුදුනට ගොස් ඇල්ලෙන් අසු පැන්න වූයේය. රජුගේ සහ අසුගේ අවසානය එතැනම

විය''[19] (බෙල්, (2005), පි.15). එතැන පිහිටි ඇල්ල අසුපැනි ඇල්ල නම් වේ. මෙම ස්ථානය පිහිටා ඇත්තේ සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගඟ ඉහළ කෝරළේ ය[20] (පොතුහැර, 1959, පි. 03,04).

## 4.4 දිප්පිටිය

ඉහත සඳහන් තිස්කුමරියන් අතුරෙන් එක් කුමරියක් ගැබ්ගෙන සිටියාය. එම කුමරියන් තිස්දෙනාගේ ම මලකඳන් මිණිකඳවලෙන් පහළට පාවී ගොස් වත්මන් දිප්පිටිය නම් ස්ථානයේ ගොඩ ගැසී තිබුණි. එය දුටු අසල්වැසියෝ එම මළමිණි ආදාහනය කළහ. පසුදින කිතුලක් මදින්නෙක් ඒ සොහොන් බිම අසලින් ගමන් කරන අවස්ථාවේ ඔහු පුදුමයට පත් කරමින් සොහොනෙහි අලු මත බිළිදෙකු සෙල්ලම් කරමින් සිටින දර්ශනයක් දුටුවේය. එම බිළිදා සෙල්ලම් කළ ස්ථානය ''සොහොන් කෙළිය'' නමින් ජනවහරට එක් වූ බව කියැවේ[21] පොතුහැර,1959, පි. 04.

දනයෙන් සපිරි සිරිකල රජ බැව් ඉසු ලු
ගුණතුම් කුමරුවෙකි නාමෙන දවාපු ලු
කෙළියෙන් සොහොන් බිම මා ඔය බඩෙහිදු ලු
සිහිවන්නේය පුවතින් දිප්පිටිය ක ලු

බිසවුන් තිසගෙ මලකුණු ගිනි දෙවියා ට
පිදුවෙන් පහළ විය කුමරෙක් එ අළු පි ට
එතුමන් වැඩුනි රජ සෙවනේ යස ලෙස ට
කවියන් බසට ගිජුවේ දිප්පිටි රුව ට[22] ( පොතුහැර,1959, පි. 04)

මදින්නා විසින් බිළිදා ඇති දැඩි කරන ලදී. පසු කාලයේ දී මේ කුමරා දිසාවේගේ මාර්ගයෙන් රජ මාළිගයට පත් විය. දවා පිලිස්සූ තැන පහළ වූ කුමරු හෙයින් දප්පුල නම් විය. ඔහු දප්පුල නමින් රජ වූ පසු දිප්පිටියේ රාජගිරි මල්පාය නම් විහාරය කරවූයේ ය.

## 4.5 කිණිහිර ගල

බුදුන් වහන්සේ යක්ෂ සහ නාග ගෝත්‍රිකයන්ගේ හිතසුව පිණිස ලක්දිවට වැඩම කළ කළ බව මහාවංශයේ සඳහන් වේ. පණ්ඩුකාභය පාලන සමයේ යක්ෂ ගෝත්‍රිකයන් සහ රජු අතර පැවති සම්බන්ධතාව පිළිබඳ තොරතුරු ලැබේ[23] (බුද්ධදත්ත හිමි, 1959, පි.59). ඔවුන් විවිධ වෘත්තීන්වල නිරත වූ බව වංශකතාවේ මෙන් ම ජනප්‍රවාදයේ සඳහන් වේ. කිනීහිර ගල යකඩ නිෂ්පාදනය සම්බධ ව ජනප්‍රවාද ගත තොරතුරු ඇතුළත් සතර කෝරළයේ පිහිටි කඳු වැටියකි. මෙම කඳුකරයේ යක්ෂ ගෝත්‍රිකයන් වාසය කළ බවත්, ඔවුන් රහසිගත ව යකඩ නිෂ්පාදනයෙහි යෙදුනු බවත් පැවසේ. මෙම කර්මාන්තය රහසිගත ව පවත්වාගෙන ගොස්

ඇත. කඳුමුදුනට ගිය දඩයක්කරුවෙකුට යකඩ තලන ශබ්දයක් ඇසී සෝදිසි කර බලද්දී යක්ෂයන්ට අසුවී ඔහු මරා දමනු ලැබීය. මෙතැනට පැමිණෙන කවරෙකු වුවත් මරා දැමීම යක්ෂයන්ගේ සිරිත විය. එම නිසා මෙම කන්ද රක්ෂාව කන්ද නම් විය.

කලකට පසු නිර්භීත පුද්ගලයෝ තිදෙනෙක් රාක්ෂාව කන්ද තරණය කළහ. එක් පුද්ගලයෙක් කඳුමුදුනට හු ශබ්ද දෙකකට පමණ දුරින් පිහිටි ගසකට නැග බලා සිටියේය. දෙවැන්නා තව ඉදිරියට ගොස් හූ ශබ්දයකට පමණ දුරින් පිහිටි ගසකට නැග බලා සිටියේය. තුන්වැන්නා කඳුමුදුනට නැග යක්ෂයන් ආයුධ පණ පොවන ආකාරය රහසිගතව බලා සිටියේය. ඔවුන් යකඩ ආයුධ පණපෙවීමට ගත්තේ මඩ බොරය.

රිදී පණ පෙවීමට ගත්තේ පුස්කරය. රහසිගතව බලා සිටි පුද්ගලයා "යකඩයට මඩ බොරත් රිදීයට පුෂ්කරත්" කියා කෑ ගැසුවේය. දෙවැන්නාට මෙය ඇසී ඔහුද එම පාඨයම ශබ්ද නගා ප්‍රකාශ කළේය. තුන්වැන්නා එම පණිවුඩය ගෙන යුහසුළුව ගමට ගියේය. පළමුවැනියා සහ දෙවැනියා යක්ෂයන් අතින් මරණයට පත්වූහ. තුන්වැන්නා යකඩ රිදී පණපොවන ආකාරය දැනුවත් කළේය. කෙසේ වෙතත් ඔහු ද යක්ෂ භයෙන් රෝගාතුර වී වැඩිකල් නො ගොස් මරණයට පත් වූවේය. යක්ෂයින් මඩ බොර ලබාගත් ස්ථානයෙන් මහා ඔය සහ කුඩා ඔය ආරම්භ වූ බව පැවසේ. සතුන් යකඩ තැලූගල කිණිහිලගල නම් විය.

රාක්ෂාව කන්ද රජවරුන් අවි ආයුධ නිෂ්පාදනය කළ ස්ථානයක් ලෙස ජනප්‍රවාදයේ එයි. රාජාධිරාජසිංහ රජුගේ පාලන සමයේදී තුවක්කු නිෂ්පාදනය මෙම ස්ථානයේදී කළ බව පැවසේ. එම කඳුකරය ආශ්‍රිත ව වෙඩි ලුණු හා ගෙන්දගම් හමුවුණු බවත්, වාර්ෂික ව රාජාධිරාජසිංහ රජුට වෙඩිබෙහෙත් අමුණු සතර (4) බැගින් මහනුවරට ගෙන යාම සිරිතක් වශයෙන් පැවති බව සඳහන් වේ. රාජාධිරාජසිංහ රජුගේ හමුදා නායකයා වශයෙන් කටයුතු කළ ලෙව්කේරාළ, පසුව ලෙව්කේ දිසාව භාර ව කටයුතු කර ඇත. කිණිහිරි ගල ආශ්‍රිත ප්‍රදේශය ලෙව්කේරාළගේ ආරක්ෂාව යටතේ පැවතින. යුධ කාලවලදී ලෙව්කේරාළ හුදකලාව රාත්‍රී භාගයේදී මෙම කිණිහිරි ගල කරා ගමන් කළ බව ජනප්‍රවාදවලින් පැහැදිලි වේ. රාත්‍රී කාලයේදී මුණගැසුනු කවියෙකු මෙම කවි ලියා ඇත.

පුන් සඳ සේම පායාලා රට මැද් දේ
රන්කෙඳි සේම පිරාලා පිට මැද් දේ
මාර සෙනග වට කරගෙන යම යුද් දේ
ලෙව්කේ මැතිඳු අද තනියම වෙල මැද් දේ

සිරිදර රාජාධි රජ සිහ එ නර පති
සිරිබර ගුණැති මැති රුවනෙකි ලෙව්කෙ පති
පිරිවර සමඟ සිව් කෝරළෙ රකින බැති
ගිරිවර කිණිහිරේ කම්මල පවත් වති[24] (පොතුහැර,1959, පි. 06)

## 4.6 කැගල්ලේ කතාව

පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට මායාදුන්නේ සහ සීතාවක රාජසිංහ යන පිය පුතු දෙපලත්, උඩරට රාජධානියේ දෙවන රාජසිංහ යන රජතුමාත් සිය ජීවිත කාලය කැප කළහ[25]. අවස්ථා කිහිපයකදී මායාදුන්නේ සහ සීතාවක රාජසිංහ කොළඹ කොටුවත්, කෝට්ටේ රාජධානියත් ආක්‍රමණය කළෝය. වරක් දෙවන රාජසිංහ රජු යුධ සෙනග පිරිවරා කොළඹ දෙසට ගමන් කරන්නේ දිවා ආහාරය සඳහා මහනුවර කොළඹ අඩිපාර අසල ගල්තලාවක වාඩි ගත්හ. සියළුම පිරිසට විඩා දුරලීමට එම ගල් තලාව උපකාරි විය. එම ගලමත සිට ආහාර ගත් බැවින් කැගල නමින් නම් කළහ. පසුව එය කැගල්ල නම් විය[26] (පොතුහැර,1959, පි. 06).

## 4.7 ගැමියාගේ නුවණ

රට පර සතුරු ආපදාවන්ට ලක් වූ අවස්ථාවලදී එම උපද්‍රව දුරලීම සඳහා සියළු වැසියෝ තමන්ට හැකි පමණින් රජුට සහයෝගය දුන්නෝය. මුහුදුබඩ පළාත් පාලනය කළ පෘතුගීසීන් මෙරටින් පළවා හැරීම සඳහා උඩරට සහ සීතාවක රජවරුන්ගේ කැපවීම ජනාදරයට පත්ව තිබුණි. ඒ හා සම්බන්ධ කතා පුවතකි මේ. පෘතුගීසීන් පලවා හැරීමට සහාය වීමට අදහස් කළ ගැමියෙක් කත්කාරයෙකුගේ වේෂය ගෙන කදේ එක් පැත්තකට අන්නාසිය ද, අනෙක් පැත්තේ විශාල මල්ලක් ද බැඳගෙන පෘතුගීසී බලකොටුවක් ඉදිරියෙන් ගමන් කළේය. අන්නාසි (පෘතුගීසී භාෂාවෙන් අනානාස්) කෑමට ගිජුකමක් දැක්වූ පෘතුගීසි හේවායෝ ඔහු හඹා ගියෝය. කද බිම දමූ ගැමියා පළා ගියේය. පෘතුගීසි හේවායෝ රිසි සේ අන්නාසි අනුභව කොට, මල්ල ද විවෘත කළෝය. මල්ලේ තිබුණේ විශාල දෙබරයකි.

## 4.8 බතලේගල

බතලේගල කැගල්ල දිස්ත්‍රික්කයේ අරණායක පිහිටා ඇති කඳු වැටියකි. උඩරට දුම්රියේ ගමන් කරන විට කඩුගන්නාව ආසන්නයේදී සතරස් කඳුමුදුනක් ඇති කන්දක් දර්ශනය වේ. මෙම කඳුකරය පොතක හැඩහුරුකමක් ගන්නා බැවින් යුරෝපීය ජාතිකයෝ බයිබල් රෝක් (Bible Rock) යන නම තැබූහ. මෙය බතලේ ගලයි. බතලේගල පිළිබඳ මෙසේ ජනප්‍රවාදයේ එයි. පෙර ලක්දිව පාලනය කළ රාවණා නමින් හඳුන්වනු ලැබූ රුදුරු බලැති රාක්ෂයෙක් වූයේය. වරෙක ඔහු ලග්ගලටත්, ලොග්ගලටත් අතර පිහිටි ලංකාපුරයේ විසූවේය. දවසක් දඩයමේ ගිය රාවණා රජු විශාල බතල අලයක් කමින් සිටි දැවැන්ත ඌරෙකු දුටුවේය. රාක්ෂයෙක් වුව ද රාවණාගේ යහපත් ගතිගුණ තිබුණි. කෑම කමින් සිටින විට සතෙකු මැරීම නුසුදුසුයැ යි සිතූ හෙතෙම දුනු දිය බිම හෙලුවේය[27]. මෙම ශබ්දය ඇසුනු ඌරා දිවගියේය. ක්‍රියාත්මක වූ රාවණා ඌරාට හීයෙන් විද්දේ ය. ඌරා මැරී වැටුනේය. ඌරා දුවනු දැක දැකත් රාවණාගේ පරිවාර යක්ෂයා ඒ ගැන සැළකිලිමත් නො වූ නිසා ඔහු ද හී පහරක් විද මරා

දැමුවේය. යක්ෂයා මැරී වැටුනු තැන මඩ ලේ පැහැ ගැන්විණි. මඩ ලේ අසල ප්‍රදේශය ''අස්මඩල'' නම් විය. දුන්න ඇටවූ ස්ථානය 'දුනු අටවන ගල' නම් විය. රාවණා රජු සෘර්ධි ඇති රජෙකු හෙයින් ඌරා කන්දක් වන්නටත්, බතලය ගලක් වන්නටත් අධිෂ්ඨාන කළේය. එය එසේම වූ බව සඳහන් වේ. දැනුදු ඌරා කන්දෙන් දිය පහරක් අස්මඩවල කරා ගලා එයි. එම දිය පාර පෙරදී ඌරාගෙන් ගැලූ ලේ පාර සිහි ගන්වයි. පසු කාලයේ දී පසු කාලයේ දී රජුගේ ආරක්ෂක මධ්‍යස්ථානයක් වශයෙන් බතලගල ප්‍රසිද්ධ විය[28].

## 4.9 ගලෙන් නැඟුනු මල

සතර කෝරළයට අයත් බෙලිගල් කෝරළයේ පිහිටි දැදිගම අනුරාධපුර රාජධානිය සමයේ උපනගරයක් විය. ක්‍රි.ව. 113 දී අනුරාධපුර රජ කළ පළමුවෙනි ගජබා රජු දවස උපනගරයක් වශයෙන් භාවිත කර තිබේ. එතුමාට විදේශවලට යාම සඳහා සාගරය තරණය කිරීමට රජතුමාට උපකාර වූයේ නීල මහා යෝධයාගේ යගදාව යි. එම යගදාව නිර්මාණය කරනු ලැබුවේ ද මෙම ප්‍රදේශයේ දීය.

ඊට පසු යගදාව තබා තිබුණු යගදාතැන්න නමින් හඳුන්වයි. රජුගේ මාලිගාව තිබුණේ මාලිගා තැන්නේය. එහි බිසෝවරුන් ක්‍රීඩාකළ ස්ථාන මුතුකෙළිය, කඳුරු ඇල්ල යන නම්වලින් හඳුන්වයි.

ක්‍රි.ව 1236 දී දඹදෙනිය රාජධානිය කරගෙන පාලනය ගෙන ගිය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජු අඹලෙන නම් ප්‍රදේශයෙහි පූජනීය ස්ථාන ගණනාවක් කරවූහ. එකල රත්නපුරයේ දෙල්ගමුව විහාරය වැඩ සිටි දළදා වහන්සේ කොණ්ඩගලට වැඩමවා පුද පූජා පැවැත්වූහ. පළමු දිනයේ ඔවුන් දළදා වහන්සේ වැඳීමට ගියේ මල් රහිතව ය. එහිදී ඒ ආසනයේ නෙළුම් මල් මතු විය. ඒ ගැන ප්‍රසන්න වූ රජු එම නෙළුම් මල් පිපුණු ස්ථාන අවට ප්‍රදේශය නෙළුම්දෙනිය යැයි නම් කොට දළදා වහන්සේට පූජා කළහ[29] (පොතුහැර,1959, පි. 07).

## 4.10 ලෙන කඩුව

සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා දැදිගම උපනගරයේ වාසය කළ අවස්ථාවකදී සතුරු වියවුලක් හට ගැනුනි. රජු සිය කඩුවෙන් සතුරන් පරාජය කොට ඒ අසල තිබූ ගල්ලෙනක කඩුව තැබීය. එම කඩුව තැබූ තැන ජයකඩුව නමින් හැඳින්විය. පසුකාලයේ ලෙන කඩුව නමින් ප්‍රසිද්ධ විය. ලෙන කඩුව පිහිටා ඇත්තේ දැදිගම ය. ඒ සම්බන්ධව මෙසේ කවක් පවතී.

පත්කොළ කැපෙයි බිබිලේ තොට පිල් ලේ
කපුටෙක් හඬයි මකුලානේ වැරැල් ලේ
බතක් ඉදෙයි ගොන්නා මඩම ඇල් ලේ

එබත බෙදයි දැදිගම මං කඩුල් ලේ[30] (පොතුහැර,1959, පි. 08).

## 4.11 දෙවනගල

සතර කෝරළයේ ගල්බඩ කෝරළයට අයත් දෙවනගල "දෙව්රජගල" නාමයෙන් ද හඳුන්වයි. උපුල්වන් දෙවිඳු හිඟුලේ කිරුම්ගල් පායේ සිට දෙවන වරට වැඩිය ස්ථානය දෙවනගල යැයි ව්‍යවහාර වේ.

මහා පැරකුම් රජුගේ උපත් බිම වන්නේ දෙවනගල සිට සැතපුම් විසිපහක් පමණ දුරින් පිහිටි දැදිගම නම් ගම්වරයයි. එතුමා පොළොන්නරුව රාජධානිය කොට විසුවද ජාතග්‍රාමය අමතක නො කළේය. ජාතගාමය (දැදිගම) මෙන්ම ඒ අවට ස්ථානයන්හි සිද්ධස්ථාන ඇති කරවන ලදී. දෙවනගල ප්‍රථමයෙන් බෞද්ධ පූජනීය ස්ථානයක් බවට පත් කරන ලද්දේ මහා පැරකුම් රජු විසිනි. දෙවන පැරකුම්බා රජු සමයේදී දෙවනගල විචිත්‍ර ආකාරයෙන් පැවතින. දෙවනගලදී පැරණි කැටයම්ද ජයශ්‍රීමහා බෝධිය ද, පොකුණද, සන්නස් දෙකක්ද දැකිය හැකිය. පර්වත මස්ථකයේ ඇති නුගරුක උපුල්වන් දෙවියන් වැඩ සිටිය නුගරුක බව කියවේ. ගලෙහි නෙලන ලද ශ්‍රී පාද ලාංඡනය මහා පැරකුම්බා රජු දවස කරවන ලද්දකි. සන්නස්වලින් හෙළිකර ඇත්තේ එම විහාරයට පූජා කරන ලද ඉඩ කඩම්වල විස්තරයක්, සහ මහා පැරකුම්බා රජු විසින් කීර්ති සහ ගිරි යන සෙනවිවරුන්ට තෑගි කරන ලද ඉඩකඩම් සම්බන්ධ විස්තරයයි[31] (පොතුහැර,1959, පි. 08).

## 5. සමාලෝචනය

සතර කෝරළයේ ඉතිහාසය ගොඩනැගීමේ දී ඒ වටා ගොඩනැගී තිබුණු ජනශ්‍රැති හෙවත් ජනප්‍රවාදයන්ගේ දායකත්වය සුවිශේෂී වේ. සමහර කතා පුවත් උඩරට රදල නායකයින් වටා ගොඩනැගී තිබීම ඒවායේ සත්‍යතාව තහවුරු කිරීමේදී සුවිශේෂී දායකත්වයක් දරයි. සමහර ජනප්‍රවාද තහවුරු කර ගැනීමේදී අවට පරිසරය හා පිහිටීම ද වැදගත්කමක් උසුලයි. ලේඛන ගත වී ඇති යුද අවස්ථා පිළිබඳ තොරතුරු තහවුරු කර ගැනීමටත්, එවැනි අවස්ථාවලදී භාවිත කළ දේශීය අවි ආයුධ දේශීය වෙඩි බෙහෙත් හා උපකරණ පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට ජනප්‍රවාදවලින් ලැබෙන පිටිවහල අතිමහත්ය ය.

## 6. ආශ්‍රිත ග්‍රන්ථ

නන්දසේන, රත්නපාල.,(1995) ජනශෘති විද්‍යාව, කොළඹ.

The Ceylon Antiquary and literary and literary register Vol ,II 1918/1919 Lewis J.P.S., Senaverathna Joha M.(Ed.) Time of Ceylon Colombo.

The Ceylon Antiquary and literary and literary register Vol ,III 1918/1919 Lewis J.P.S., Senaverathna Joha M.(some Sinhalese custom and Folk) Ed. Time of Ceylon Colombo.

Administration Report Western Province 1889 P.1 P.189, Government printing.

The Ceylon Antiquary and literary and literary Register Vol ,IV 1919/1920 Lewis J.P.S., Senaverathna Joha M.(Ed.) Time of Ceylon Colombo.

The Ceylon Antiquary and literary and literary Register Vol ,IV 1919/1920 Lewis J.P.S., Senaverathna Joha M.(Ed.) Time of Ceylon Colombo.

තෙන්නකොන්, විමලානන්ද.,(1962), උඩරට මහ කැරැල්ල, තෙවන කාණ්ඩය, එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

කරුණාරත්න, අතුකෝරළ., (1966). සතර කෝරළය, කොළඹ.

පොතුහැර, ඒ. එච්.,( 1959), සතර කෝරළයේ ජනප්‍රවාද, කොළඹ.

අතුකෝරාළ, කරුණාරත්න.,(1996), සතර කෝරළේ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

The Ceylon Antiquary and literary and litery Regis ton Vol ,V 1919/1920 Lewis J.P.S., Senaverathna Joha M.(Ed.) Time of Ceylon Colombo.

The Ceylon Antiquary and literary and literary Regis ton Vol ,10, 1924/1925 Lewis J.P.S., Senaverathna Joha M.(Ed.) Time of Ceylon Colombo.

කොළඹ කෞතුකාගාර පුස්තකය අංක 1280

The Ceylon Antiquary and literary and literary Regis ton Vol ,10, 1924/1925 Lewis J.P.S., Senaverathna Joha M.(Ed. Time of Ceylon Colombo

Sills. L David., (1968), "Folklore" international Encyclopedia of the Social Sciences - Vol V, P.496.

කොළඹ කෞතුකාගාර පුස්තකය අංක 1280

Vansina, Jan,.(1965), oral Tradition, Londan, P.I

යටවර, එම්. ඩී. එම්. එස්.(2009), කෑගලු කෝරළ පවත, ආරිය ප්‍රකාශන, වරකපොළ.

බෙල්, එච්. සී. පී.,(2005), සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳ වාර්තාව, එඩ්මන්ඩ් කේ. බී. ඒ. (පරි.), පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

කෑගලු විත්ති, (2010), කෑගල්ල දිසාපති කාර්යාලීය ප්‍රකාශන, කෑගල්ල.

පොතුහැර, ඒ. එච්.,( 1959), සතර කෝරළයේ ජනප්‍රවාද, කොළඹ.

පොතුහැර, ඒ. එච්.,( 1959), සතර කෝරළයේ ජනප්‍රවාද, කොළඹ.

මහාවංසය (සංස්.),  බුද්ධදත්ත ඒ. පී. (1959). කොළඹ.

පොතුහැර, ඒ. එච්.,( 1959), සතර කෝරළයේ ජනප්‍රවාද, කොළඹ.

පොතුහැර, ඒ. එච්.,( 1959), සතර කෝරළයේ ජනප්‍රවාද, කොළඹ.

පොතුහැර, ඒ. එච්.,( 1959), සතර කෝරළයේ ජනප්‍රවාද, කොළඹ.

මහාවංසය (සංස්.),  බුද්ධදත්ත ඒ. පී. (1959). කොළඹ.

කරුණාරත්න, අතුකොරළ., (1966). සතර කොරළය, කොළඹ.

පොතුහැර, ඒ. එච්.,( 1959), සතර කෝරළයේ ජනප්‍රවාද, කොළඹ.

පොතුහැර, ඒ. එච්.,( 1959), සතර කෝරළයේ ජනප්‍රවාද, කොළඹ.

පොතුහැර, ඒ. එච්.,( 1959), සතර කෝරළයේ ජනප්‍රවාද, කොළඹ.